" සියළු හිමිකම් ඇවිරිණි "

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2020
පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර මාලාව

ඉතිහාසය II © All Right Received www.learntv.lk කාලය: පැය 03

සැලකිය යුතුය:

(I) කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
(II) කොටසේ ප්‍රශ්න හතරකට ද, (III) කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

**01**. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද,(ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර දක්වන්න.

(i) යෝධ වැව, නල්ලූර් කෝවිල, ගොඩවාය, පුලතිසිපුර, පෙඩ්රික් කොටුව, වන නදි, කාවරගාම, මැණික් ගඟ, නාගදීපය, මිහින්තලේ, තබ්බෝව වැව, උඩවලව ජලාශය.

(ලකුණු 12 යි.)

(ii) ගෝව, බතාවිය, මලය අර්ධද්වීපය, කොන්ස්තන්තිනෝපල් නගරය, කාම්බෝජය, කළු මුහුද.

(ලකුණු 6 යි.)

(ආ) පහත A ,B ,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - පෙරදිග ජයගත් මුල්ම පෘතුගීසි ජාතිකයා.
B - ජාතීන්ගේ සංගමයේ නිර්මාතෘවරයා.
C - අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා.
D - ලංකාව අවසන් වරට එක්සේසත් කළ රජතුමා.

(ලකුණු 4 යි.)

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

* A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



(iii) 1. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?
2. එම පුද්ගලයා ජීවත් වූ රට කුමක්ද?
3. එම පුද්ගලයා කුමන වෘත්තියකට අයත් ද?
4. එම පුද්ගලයා ලංකාව සම්බන්ධයෙන් කළ නිර්මාණය කුමක්ද?

(ලකුණු 4 යි.)



(iv) 1. රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?
2. එම පුද්ගලයා බිහිකළ පාලන ව්‍යවස්ථාව කුමක්ද?
3. ඔහු මෙරට තුළ දී දැරූ ඉහළම ධුරය කුමක්ද?
4. ඔහු ගොඩනැගූ ව්‍යවස්ථාව අනුව ලංකාව හැඳින්වූ නම කුමක්ද?

(ලකුණු 4 යි.)

<u>II කොටස</u>

**02.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ඇසුරින් පහත කොටස්වලට පිළිතුරු සපයන්න. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරන්න.

a – ගල් යුගයේ මානවයා ජීවත් වූ පහතරට වියළි කලාපීය ලෙන
b – මිනිස් ඇටසැකිලි තිහක් හමු වූ ප්‍රාග් ඓතිහාසික ස්ථානය
c – පුලුස්සා ආහාරයට ගත් කැලෑ දෙල් ඇට පිළිබඳ සාක්ෂි හමුවු ස්ථානය.

( බෙල්ලන්බැඳි පැලැස්ස, කිතුල්ගල බෙලිලෙන, සීගිරියේ පොතාන )

(ලකුණු 3 යි.)

(ii) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක 4 ක් නම් කරන්න.
(ලකුණු 4 යි.)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුණු ලක්ෂණ 2 ක් විස්තර කරන්න.
(ලකුණු 5 යි.)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මිනිසා ඉහළ තාක්ෂණයක් වෙත යොමු වී සිටි ආකාරය කරුණු 3 ක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි.)

LearnTV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එළ කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

**03**. (i) පහත සඳහන් මූලාශ්‍ර අයත් රජවරු නම් කරන්න

A – වල්ලිපුරම් රන්පත
B – තෝනිගල සෙල්ලිපිය
C – බදුලු ටැම් ලිපිය

(ලකුණු 3 යි.)

(ii) පහත සඳහන් වැව් ඉදි වූයේ කුමන ගංගාව ආසන්නයේ දැයි වරහන් තුළින් තෝරා ලියන්න

A – පරාක්‍රම සමුද්‍රය
B – ඉරණමඩු වැව
C – තබ්බෝව වැව
D – නාච්චිදූව වැව

( කනගරායන් ආරු, මහවැලි ගඟ, මල්වතු ඔය, වලවේ ගඟ, මී ඔය )

(ලකුණු 4 යි.)

(iii) මෙරට වාරි කර්මාන්තයේ ප්‍රගතිය උදෙසා වසභ රජුගෙන් සිදුවූ වැදගත් කාර්යභාරයන් 2ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 5 යි.)

(iv) රාජ්‍යත්ව සංකල්පය බලවත් වීමෙන් පසු වගකීම් රැසක් ඉටු කිරීමට අතීත රජවරු කටයුතු කර ඇත. ඒ අනුව අතීත රජවරුන්ගේ වගකීම් හා කාර්යභාරයන් තුනක් නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි.)

Learn TV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

**04**. (i) දෙවන නාගරීකරණ සමය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
පහත කරුණු වලට අදාළ රාජධානි නම් කරන්න.

A – ඉබන් බතූතා ලංකාවට පැමිණීම.

B – දළදා සිරිත නම් කෘතිය රචනා කිරීම.

C – සපුමල් කුමරු යාපනය යටත් කර ගැනීම.

(ලකුණු 3 යි.)

(ii) පහත සඳහන් කරුණු වලට අයත් රජවරු වරහන් තුළින් තෝරා ලියන්න

A – කාලිංග මාඝ පරාජය කිරීම.

B – පෘතුගීසීන් පැමිණෙනවිට කෝට්ටේ පාලකයා වීම.

C – සුනේත්‍රා දේවි පිරිවෙන ඉදිකරවීම.

D – ඇම්බැක්කේ දේවාලය ඉදිකරවීම.

( IV පරාක්‍රමබාහු රජු, VI පරාක්‍රමබාහු රජු, III විජයබාහු රජු, VIII වීර පරාක්‍රමබාහු රජු, II පරාක්‍රමබාහු රජු, III වික්‍රමබාහු රජු )

(ලකුණු 4 යි.)

(ii) පෘතුගීසි උඩරට රාජධානිය යටත්කරගැනීමට කෙතරම් උත්සාහ කලද එම සියලු උත්සාහයන් අසාර්ථක විය.නමුත් පෘතුගීසීන්ට පහසුවෙන් යාපනය යටත්කර ගැනීමට හැකි විය. ඊට බලපෑ හේතු දෙකක් නිදසුන් සපයමින් විස්තර කරන්න.

(ලකුණු 5 යි.)

(iv) දෙවන නාගරීකරණ සමයේ මෙරට ආර්ථිකයේ ඇති වූ සුවිශේෂී වෙනස්කම් කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 6 යි.)

Learn TV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබදව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

05. (i) මහනුවර රාජධානිය සම්බන්ධ රජවරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A – මහනුවර දළදා මාලිගාවේ පත්තිරිප්පුව ඉදිකරවීම.

B – I විමලධර්මසූරිය රජුගෙන් පසු උඩරට රජ වීම.

C – සිංහලයේ අවසන් රජු ලෙස කටයුතු කිරීම.

(ලකුණු 3 යි.)

(ii) උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා පෘතුගීසින් සිදු කළ සටන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.

a – පහත සටන්වලට නායකත්වය ගත් රජවරු පිළිවෙලින් ලියා දක්වන්න.

- බලන සටන
- ගන්නෝරු සටන

b – පහත සටන් වලට නායකත්වය ගත් පෘතුගීසි නායකයන් පිළිවෙල ලියා දක්වන්න.

- දන්තුරේ සටන
- රන්දෙනිවල සටන

(ලකුණු 4 යි.)

(iii) උඩරට රාජධානිය ප්‍රගතිය උදෙසා I විමලධර්මසූරිය රජුගෙන් සිදුවූ ආගමික හා දේශපාලන සේවාවන් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 5 යි.)

(iv) ක්‍රි.ව 1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍ය බ්‍රිතාන්‍ය සතු වීමට බලපෑ හේතු 3 ක් විස්තර කරන්න.

(ලකුණු 6 යි.)

Learn TV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබදව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

## III කොටස

**06**. යුරෝපයේ පුනරුදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) පුනරුද සමයට පෙර යුරෝපා වෙළෙඳ කටයුතුවලදී කැපී පෙනුන මධ්‍යධරණී මුහුද ආශ්‍රිත වෙළෙඳ නගර 3 ක් නම් කරන්න.

(ලකුණු 3 යි.)

(ii) පුනරුද සමයේ පහත කරුණු වලට අදාළ පුද්ගලයන් නම් කරන්න.

A – ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට නායකත්වය ගත් ජර්මන් ජාතිකයා.

B – මුද්‍රණ යන්ත්‍රය නිපදවීමට කටයුතු කිරීම.

C – ගුරුත්වාකර්ෂණ නියමය සොයාගැනීම

D – ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය නම් චිත්‍රය නිර්මාණය කිරීම.

(ලකුණු 4 යි.)

(iii) පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ දේශ ගවේෂණ ව්‍යාපාර සාර්ථක වීමට බලපෑ හේතු 2 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 5 යි.)

(iv) යුරෝපයේ පුනරුදය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජීය අංශවලට ඇති වූ වෙනස්කම් උදාහරණ සහිත විස්තර කරන්න.

(ලකුණු 6 යි.)

LearnTV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

**07**. (i) ඇමරිකන්, ප්‍රංශ හා රුසියන් විප්ලව ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A – ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා.

B – ප්‍රංශ විප්ලව සමයේ ප්‍රංශයේ සිටි රජතුමා.

C – 1917 රුසියන් විප්ලවයෙන් බලයට පත් පාලකයා.

(ලකුණු 3 යි.)

(ii) ඇමරිකන් විප්ලවයට හේතු වූ පනත් 2 ක් හා ප්‍රංශ විප්ලවයට හේතු වූ ප්‍රධාන බදු වර්ග 2 ක් පිළිවෙලින් ලියා දක්වන්න.

(ලකුණු 4 යි.)

(iii) ඇමරිකන් ජනපදවාසීන් පීඩාවට පත්කරමින් බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති 2 ක් විස්තර කරන්න.

(ලකුණු 5 යි.)

(iv) ප්‍රංශ විප්ලවයට හේතු වූ දේශපාලන සාධක කරුණු 3 ක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 6 යි.)

LearnTV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.